වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 311

5 වන මහල, 1 වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල

දු.අ.-0112872054/0112887164

ෆැක්ස්- 0112872061/0112872048

ඊ මේල්-info@nppd.gov.lk

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය මතුවූ බැවින්, ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගෙන 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින් 2000 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව බවට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්ම සැකසීමෙන් අනතුරුව ඊට අනුගත වන ලෙස ශ්‍රී ලංකාවේ පළාත් නවය සඳහා වෙන වෙනම ඒ ඒ පළාතේ ගැටළු හඳුනා ගනිමින් ද පවතින සම්පත් උපරිමව උපයෝගී කරගනිමින් ද තිරසාර සංවර්ධනයක් උදෙසා මාර්ගෝපදේශයක් ලබා දීමට කලාපීය භෞතික සැලසුම් සකස් කිරීම සිදු කෙරේ.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් ඵලදායී ලෙස භාවිත කරමින් ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින් ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරව්‍යුහ පහසුකම්වලින් යුතු නගර හා සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීම සිදු කරයි.

ඊට අමතරව ලංකාවේ ප්‍රධාන පූජාභූමිවල විධිමත් සංවර්ධනය උදෙසා වින්‍යාස සැලසුම් සැකසීමත්, ඊට අනුරූපීව ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, එම ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම්ද ඇස්තමේන්තු සකස් කර දීමත් සිදු කරමින් ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනරුදය සඳහා ද විශාල දායකත්වයක් ලබා දේ.

ඉහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉටු කළ සහ ඉටුකරමින් සිටින මෙහෙවර අති මහත්ය.

මෙම කර්තව්‍යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන කලාපීය භෞතික සැලසුම් අංශය, ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය, ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යාත්මක අංශය යන අංශ සාමූහිකව කැප වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු”

මෙහෙවර

“ ජාතික භෞතික ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, පළාත් බද හා ප්‍රාදේශීය සැලසුම් මගින් එම ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සහ පාලනය කිරීම”


අරමුණු

1. ශ්‍රී ලංකාවේ සැලසුම්ගත තිරසාර හා සොඳුරු භෞතික සංවර්ධනයක් අරමුණු කරගෙන, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම නිර්මාණය කිරීම.
2. ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම්කරණයක යෙදීම.
3. භෞතික සංවර්ධනයන් සැලසුම් කිරීම සඳහා ඕනෑම ආයතනයකට හෝ සංවිධානයකට අවශ්‍ය සහයෝගය ලබාදීම.
4. විශ්වාසනීය හා ඵලදායී සේවාවක් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ ධාරිතාවය සංවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාව සඳහා ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම සකස් කිරීම.
2. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සමග සැසඳෙන කලාපීය හා ප්‍රාදේශීය සැලසුම් සකස් කිරීම.
3. ඉඩම් සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම.
4. ස්වභාවික ලෙස විසිතුරු ස්ථාන සහ ගෘහනිර්මාණමය ඓතිහාසික වශයෙන් වැදගත් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, යටිතල පහසුකම්, පොදු පහසුකම් හා සේවාවන් සැපයීම තහවුරු කිරීම.

1.4 සංවිධාන සටහන - පිටු අංක 03 හි දැක්වේ.


ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
සංවිධාන සටහන
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රියාත්මක කිරීම්)
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (මුදල්)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
අධ්‍යක්ෂ (ප්‍රාදේශීය භෞතික
අධ්‍යක්ෂ (ජාතික හා කලාපීය භෞතික සැලසුම්)
අධ්‍යක්ෂ (පර්යේෂණ)
අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)
අධ්‍යක්ෂ (සම්බන්ධීකරණ හා
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (පාලන)
නීති නිලධාරී
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (මුදල්)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ)
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු)
පරිපාලන නිලධාරී
කොරතුරු හා සන්නිවේදන තාක්ෂණ
සැලසුම් කාර්යාල සහකාර
ජ්‍යෙෂ්ඨ ප්‍රමාණ සම්ක්ෂණ සහකාර
ප්‍රධාන පරීක්ෂක
සංවර්ධන නිලධාරී/ සහකාර
සංවර්ධන නිලධාරී/ සහකාර
භෞතික සැලසුම් සහකාර
සංවර්ධන නිලධාරී/ සහකාර
භෞතික සැලසුම් සහකාර
භෞතික සැලසුම් සහකාර (නගර සැලසුම්)
භෞතික සැලසුම් සහකාර
සංවර්ධන නිලධාරී/ සහකාර
සංවර්ධන නිලධාරී/ සහකාර
සැලසුම් ශිල්පි
ප්‍රමාණ සම්ක්ෂණ
පරීක්ෂක / කාර්මික
භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණික ශිල්පි
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
රියදුරු
ඕවසියර්
පිළිගැනීමේ නිලධාරී
කාර්යාල කාර්ය සහායක, සංචාරක බංගලා භාරකරු, සංචාරක බංගලා සහායක, කම්කරු, මුරකරු, උද්‍යාන කම්කරු,
කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය
කාර්යාල කාර්ය සහායක
සැලසුම් මුද්‍රණකරු, සැලසුම් භාරකරු, සැලසුම්
කාර්යාල කාර්ය සහායක
කම්කරු , මුරකරු , උද්‍යාන කම්කරු, සනීපාරක්ෂක
මැනුම් සහායක

1.5 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන අංශවලින් සමන්විතය.

1. කලාපීය භෞතික සැලසුම් අංශය
2. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය
3. පර්යේෂණ අංශය
4. සම්බන්ධීකරණ හා නියාමන අංශය
5. වාස්තු විද්‍යා අංශය
6. ඉංජිනේරු අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

1.6 2020 වසරේ මුල් භාගයේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය මගින් ලැබුණු අතර, පසුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය මගින් ලැබුණි.


02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම


විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

විශේෂ ජයග්‍රහණ

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතට අනුකූලව සියළුම හවුල්කාරී ආයතන සමග පුළුල් ලෙස සාකච්ඡා කොට ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම-2050 සකස් කර 2019 ජූනි 23 දින ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලදි. අමප/19/3454/206/002 අංක හා 2020 ජනවාරි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එම සැලැස්ම වර්තමාන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ලේඛනයේ අවධාරණය කොට ඇති ජාතික භෞතික සැලසුමෙහි වපසරියට අයත් වන ''භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය'' යන පරිච්ඡේදයේ ඇතුලත් යෝජනා හඳුනාගෙන ඒවාද ඇතුලත් කොට ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම - 2050" යාවත්කාලීන කිරීම සඳහා පහත සඳහන් කටයුතු 2020 වසරේ දී සිදු කරන ලදී.


- ජාතික භෞතික සැලැස්ම 2011-2030, 2019-2050 සහ වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය "සෞභාග්‍යයේ දැක්ම" සමාලෝචනය කිරීම
- තොරතුරු රැස් කිරීමේ කටයුතු






2. අදාල ප්‍රාදේශීය සභාවල ඉල්ලීම පරිදි සැලසුම් සකස් කරන ලද නගර

i. උඩුබද්දාව



ii. දමන



3. 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතේ 6(2)අ වගන්තියෙන් **ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට ලැබී ඇති බලතල අනුව බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම ද සලකා බලමින්** පූජාභූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද ආගමික ස්ථාන

i. පොළොන්නරුව පූජා භූමිය
ii. බිංගිරිය රජමහා විහාරය
iii. කොළවෙනිගම රජමහා විහාරය
iv. ඇඹුල්ගම රජමහා විහාරය
v. ඔලබොඩුව රජමහා විහාරය

4. ඉහත සඳහන් පරිදි ගැසට් කරන ලද පූජා භූමි සඳහා ගැසට් පත්‍රයේ නියෝගයට අනුව පරිබාහිර (වින්‍යාස) සැලසුම් සකස් කරන ලද පූජා භූමි

i. අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය සඳහා වින්‍යාස සැලසුම් සකස් කිරීම ආරම්භ කරන ලදී.
ii. ඔලබොඩුව රජමහා විහාරය සඳහා වින්‍යාස සැලසුම නිම කරන ලදී.
iii. මුල්කිරිගල රජaමහා විහාරය සඳහා වින්‍යාස සැලසුම නිම කරන ලදී.

5. පහත සඳහන් ව්‍යාපෘති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ දී නිම කරන ලදී.

1. කතරගම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

I. පහසුකම් ගොඩනැගිලි තුනක් ඉදිකිරීම (වනජීවී කපොල්ල අසල, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තු කාර්යාලය අසල සහ කිරි වෙහෙර අසල)
II. පොලිස් මුර පොළවල් 04 ක් ඉදිකිරීම. (පාලම් අංක 03 අසල, වනජීවී කපොල්ල අසල, ගෝතමීගම පිවිසුම අසල සහ නාගහවීදිය පිවිසුම අසල)
III. කතරගම පූජා භූමිය වටා කි.මී. 3.5 ක ආරක්ෂක වැටක් පවතින අතර, එයින් කි.මී. 1.5 ක් ආරක්ෂක වැට සාදා නිම කරන ලදී.

2. අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය

- ලෝලුගස්වැව ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර ව්‍යාපෘති කාර්යාලය සාදා නිම කරන ලදී.

6. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර දී ඇත.

අනු අංකය	ස්ථානය	ව්‍යාපෘතිය
01	කතරගම පූජා භූමිය	I. කෑගලු මාතා මෙහෙනි ආරාමයේ ආවාස ගෙය ඉදි කිරීම II. සතර මහා දේවාලය, කුඩා කතරගම දේවාලය සහ කාලි දේවාලය සඳහා යෝජිත මුරුතැන්ගෙවල් ඉදිකිරීම

		III.ස්කෑන් මැෂින් යන්ත්‍රයක් සවි කිරීම සඳහා කතරගම පොලීසිය වෙත ගොඩනැගිලි සැලැස්මක් සකස් කරන ලදී.
02	අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය	i. රුවන්වැලිසෑය පූජා භූමිය වටා වැටක් ඉදිකිරීම ii. රුවන්වැලිසෑය පූජා භූමියේ ප්‍රධාන පිවිසුම සඳහා තොරණක් ඉදි කිරීම
03	තිරියාය ගිරිහඬුසෑය රජමහා විහාරය	යෝජිත දාන ශාලාව, විශ්‍රාම ශාලාව හා බුදු මැදුර, අටවිසි බුදු කුටිය, වාහල්කඩ.
04	අම්පාර පුංචි සීගිරිය රජමහා විහාරය	කෞතුකාගාරය, ධර්ම ශාලාව, සීමා මාලකය ඉදි කිරීම
05	ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාමය	යෝජිත බහු කාර්ය ගොඩනැගිල්ල, සංඝාවාසය හා බුදු මැදුර ධර්ම ශාලාව සහ දහම් පාසල් ගොඩනැගිල්ල
06	අළුවිහාරය පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය	යෝජිත වළාකුළු බැම්ම පහත සඳහන් ගොඩනැගිලි සඳහා වාස්තු විද්‍යා සැලසුම් සකස් කිරීම ආරම්භ කරන ලදී. • ත්‍රිපිටක කෞතුකාගාරය • බහුකාර්ය ගොඩනැගිල්ල • පහසුකම් ගොඩනැගිල්ල • කෑම කාමරය හා මුළුතැන්ගෙය • වැසිකිළි පද්ධතිය • භූ දර්ශන සැලැස්ම • රථ වාහන නැවතුම්පළ
07	දැදිගම කොටවෙහෙර රජමහා විහාරය	වළාකුළු බැම්ම හා වාහල්කඩ 02 ක් සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම් ලබා දෙන ලදී.
08	දිඹුලාගල, පල්ලේවැව ශ්‍රී අශෝකාරාමය	ස්ථූපයක් ඉදිකිරීම
09	වැවුරුකන්නල රජමහා විහාරය	වාහල්කඩ සහ වළාකුළු බැම්ම ඉදි කිරීම
10	සේරුවාවිල රජමහා විහාරය	යෝජිත දාන ශාලාව, ගිණිහල්ගෙය, සංඝාවාසය, මුළුතැන්ගෙය, වැසිකිළි පද්ධතිය සහ සංචාරක බංගලාව

අභියෝග

දෙපාර්තමේන්තුවේ අරමුණු ලභා කර ගැනීමේ දී, මානව සම්පත් හිහකම මුහුණපා ඇති ප්‍රධානතම අභියෝගයයි. දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ යෙදී සිටිනුයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 65% කටත් වඩා අඩු ප්‍රමාණයකි. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සැලසුම්කරණය සම්බන්ධව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආයතනය වුවද, මෙහි සැලසුම්කරණය සම්බන්ධ විධායක මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 04 ම සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු 30 ක්ම

පුරප්පාඩුව පවතී. දැනට සැලසුම්කරණයේ යෙදී සිටින්නේ ද්විතීයික මට්ටමේ අනුමත තනතුරු 34න් 28 කගෙන් සමන්විත වෘත්තිකයින් සංඛ්‍යාවක් පමණි.

මේ වසර තුළ දී මුහුණ දුන් අනෙක් ප්‍රධානම අභියෝගය වූයේ මුළු ලොවටම අභියෝගයක් වූ කොවිඩ් 19 වසංගත තත්ත්වයයි.

ඉදිරි ඉලක්ක-

2021 වසරේ දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට බලාපොරොත්තු වන කටයුතු.


1. මෙම වාර්තාවේ දෙවන පරිච්ඡේදයේ විශේෂ ජයග්‍රහණ යටතේ අංක 01 න් දක්වා ඇති පරිදි ජාතික භෞතික සැලැස්ම 2050 යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එහිදී
   I. ජාතික භෞතික සැලැස්ම 2011-2030, 2019-2050 සහ වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය "සෞභාග්‍යයේ දැක්ම " සමාලෝචනය කිරීම
   II. වර්තමාන රජයේ ප්‍රතිපත්තිය වන සෞභාග්‍යයේ දැක්ම ප්‍රකාශයේ 7 වන පරිච්ඡේදය වන ''භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය'' යන පරිච්ඡේදයේ ජාතික භෞතික සැලැස්මට අත්‍යාවශ්‍ය අංග අර්ථ දැක්වීම.
   III. විවිධ ක්ෂේත්‍රවලට අදාළ දත්ත රැස් කිරීම සහ ඒවා විශ්ලේශනය කිරීම.
   IV. යාවත්කාලීන තොරතුරු අනුව ජාතික භෞතික සැලැස්මේ සංකල්පීය සැලැස්ම සකස් කිරීම.
   V. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ජාතික භෞතික සැලැස්ම සකස් කිරීම පිළිබඳව තාක්ෂණික උපදෙස් ලබා දීම සඳහා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතේ 5 (ඇ) වගන්තියට අනුව පිහිටවනු ලබන කාර්මික උපදේශක කමිටුවට ඉදිරිපත් කිරීම.
   VI. රජයේ ප්‍රතිපත්ති සම්පාදකයන් සහ වෘත්තිකයන් සමග සාකච්ඡා කිරීම
   VII. යෝජිත අවකාශීය ව්‍යුහය සකස් කිරීම.
   VIII. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද භෞතික නිර්මාන විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතේ 4, 2 (අ) හි සඳහන් විෂය භාර අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශ වල ලේකම්වරුන්ගෙන් සමන්විත අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව සහ 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතේ 3 වන වගන්තියේ සඳහන් පරිදි පිහිටුවනු ලැබූ ජාතික භෞතික නිර්මාණ සභාව වෙත ඉදිරිපත් කිරීම
   VIII. යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම (2050) ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම
   යන පියවර අනුගමනය කිරීමට නියමිතය.

2. සීඝ්‍රයෙන් අවිධිමත් ලෙස සංවර්ධනය වන ජනාවාස සැලකිල්ලට ගෙන විධිමත් සංවර්ධනයකට මාර්ගෝපදේශ ලබාදීම සඳහා පහත සඳහන් පළාත් තුන සඳහා කලාපීය සැලසුම් සකස් කිරීම ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
   I. උතුරු පළාත
   II. නැගෙනහිර පළාත

III. ඌව පළාත

3. පහත සඳහන් පරිදි සෑම පළාතකම පළාත් පාලන කොමසාරිස් විසින් තෝරා එවන ලද සහ අදාල ප්‍රාදේශීය සභාවල ඉල්ලීම පරිදි කුඩා නගර 20 ක් සඳහා ප්‍රාදේශීය සැලසුම් සකස් කිරීමට නියමිතය.

අනු අංකය	පළාත	නගරය
01	මධ්‍යම	අංකුඹුර විල්ගමුව
02	දකුණ	නාගොඩ තල්ගස්වල
03	ඌව	මීගහකිවුල සියඹලාණ්ඩුව
04	සබරගමුව	රාස්සගල පින්නවල අයගම
05	වයඹ	පොල්පිතිගම නවගත්තේගම
06	උතුර	මුරුන්ගන් පලායි තන්නීරුටු නෙලුක්කුලම් නෙදුන්කෙනි
07	උතුරු මැද	කැබිතිගොල්ලෑව
08	නැගෙනහිර	වවුනතිවු කොක්අඩිවෝලෙයි ඉරක්කමම්



Town	Status
Polpithigama	Ongoing
Nawagattegama	Ongoing
Meegahakiwla	Ongoing
Siyambalanduwa	Ongoing
Pinnawala	Ongoing
Rassagala	Ongoing
Kokadicholai	Ongoing
Vavunathivu	Ongoing
Maha Oya	Ongoing
Irakkamam	Ongoing
Murunkan	Ongoing
Pallai	Ongoing
Tanniyutttu	Ongoing
Nelukkulam	Ongoing
Nedunkeni	Ongoing
Nagoda	Ongoing
Talgaswala	Ongoing
Ankumbura	Ongoing
Wilgamuwa	Ongoing
Kebithigollewa	Ongoing

4. අනුරාධපුර, ඇතුල් නුවර පුරාවිද්‍යා සංරක්ෂිත ප්‍රදේශය තුළ පදිංචිකරුවන් ක්‍රමානුකූලව පුනස්ථාපනය කිරීම සඳහා ලෝලුගස්වැව නගර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2021 වර්ෂයේ දී එම ව්‍යාපෘතියේ පහත සඳහන් අදියර ක්‍රියාත්මක කිරීමට නියමිතය.

I. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉඩම ලබා ගැනීම
II. අදියර 01 සඳහා භූමිය ශුද්ධ කිරීම
III. අදියර 01 සඳහා සවිස්තරාත්මක මිනින්දෝරු සැලැස්ම සකස් කිරීම
IV. අදියර 01 සඳහා මාර්ග පද්ධතිය සකස් කිරීම
V. ඉදිකරමින් පවතින ව්‍යාපෘති කාර්යාලයේ වැඩ නිම කිරීම

5. 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතේ 6(2)අ වගන්තියෙන් **ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට ලැබී ඇති බලතල අනුව, නැගෙනහිර ආගමික සිද්ධස්ථානවලට එල්ල වන ගැටලුකාරී තත්ත්වයන් සලකා බලමින් ඒවා ද ඇතුළත්ව බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම් ද ඇතුළත්ව පහත සඳහන්** ආගමික ස්ථාන පූජා භූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම සහ එම ගැසට් පත්‍රයේ නියෝගයට අනුව පූජා භූමි සඳහා පරිබාහිර සැලසුම් සකස් කිරීමට යෝජිතය.

ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි

I. මුහුදු මහා විහාරය - අම්පාර
II. පියංගල රජමහා විහාරය - අම්පාර
III. මගුල් මහා විහාරය - අම්පාර
IV. ගිරිහඬුසෑය - ත්‍රිකුණාමලය
V. පියංගල රජමහා විහාරය - කොටසර
VI. මහසෙන් රජමහා විහාරය - පොළොන්නරුව
VII. මාම්පිට වළගම්බා රජමහා විහාරය - කෑගල්ල
VIII. කසාගල රජමහා විහාරය - හම්බන්තොට
IX. බුදුරුව යාය විහාරය - පොළොන්නරුව

ගැසට් මගින් පූජා භූමි ලෙස ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් ආගමික ස්ථාන සඳහා පරිබාහිර සැලසුම් සකස් කිරීමට යෝජිතය.

I. අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය
II. කතරගම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය
III. සොළොස්මස්ථාන රජමහා විහාරය - පොළොන්නරුව
IV. මඩු දේවස්ථානය - මන්නාරම
V. මුහුදු මහා විහාරය - අම්පාර
VI. දීඝවාපිය රජමහා විහාරය - අම්පාර
VII. ගිරිහඬුසෑය රජමහා විහාරය - ත්‍රිකුණාමලය
VIII. කොලවෙනිගම රජමහා විහාරය - මාතර
IX. බිංගිරිය දේවගිරි රජමහා විහාරය - කුරුණෑගල
X. සේරුවාවිල රජමහා විහාරය - ත්‍රිකුණාමලය

XI. අළුවිහාර පූජා භූමිය - මාතලේ

XII. පත්තිනි දේවාලය - නවගමුව

6. පූජා භූමි සංවර්ධන ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යා සැලසුම්, ඉංජිනේරු සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම.

අනු අංකය	ස්ථානය	ව්‍යාපෘතිය
01	කතරගම පූජා භූමිය	• වින්‍යාස සැලැස්ම සකස් කිරීම • වින්‍යාස සැලැස්මෙන් හඳුනාගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වාස්තු විද්‍යා සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම. • ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අධීක්ෂණය කිරීම.
02	අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය	• වින්‍යාස සැලැස්ම නිම කිරීම
03	අළුවිහාරය පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය	• වින්‍යාස සැලැස්ම සකස් කිරීම • කෞතුකාගාරය, වැසිකිළි පද්ධති, පහසුකම් ගොඩනැගිලි, මුළුතැන්ගෙය සහ කෑම කාමරය, බහුකාර්ය ගොඩනැගිල්ල සහ රථගාල සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම. • භූ දර්ශන සැලැස්ම සකස් කිරීම. • ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අධීක්ෂණය කිරීම.
04	මාතර මන්තින්ද විහාරය සහ පිරිවෙන් පූජා භූමිය	දාන ශාලාව හා ආවාස ගෙය සඳහා ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, ඉදිකිරීම් කටයුතුවලදී අධීක්ෂණය
05	කෑගල්ල, උග්ගල් අළුත්නුවර කතරගම දේවාල පූජා භූමිය	විශ්‍රාම ශාලාව, සනීපාරක්ෂක ගොඩනැගිල්ල සහ නිලමේ නිල නිවාසය සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් ඇස්තමේන්තු ලබාදීම. • ඉදිකිරීම් කටයුතුවලදී අධීක්ෂණය • වින්‍යාස සැලැස්ම සකස් කිරීම
06	මුල්කිරිගල රජ මහා විහාරය	බහුකාර්ය ගොඩනැගිල්ල, ආවාස ගෙය සඳහා ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, ඉදිකිරීම් කටයුතුවලදී අධීක්ෂණය

07	ගැටබරුව රජ මහා විහාරය	විශ්‍රාම ශාලාව සහිත සංඝාවාසය සඳහා ව්‍යුහාත්මක සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම, ඉදිකිරීම් කටයුතුවලදී අධීක්ෂණය

7. වෙනත් ආයතන වලින් කෙරෙන ඉල්ලීම් අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරදීමට බලාපොරොත්තු වේ.

අනු අංකය	ආයතනය	ව්‍යාපෘතිය
01	බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව	නක්කල කුඹුක්කන්ඔය අසබඩ ගිමන්හලක් සහ පාරිසරික කලාපයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කිරීම

8. පූජනීය ස්ථාන පූජා භූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේදී සලකා බලනු ලබන නිර්ණායක සංශෝධනය කිරීම.


9. දැනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් පූජා භූමි ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙසම වන අතර, ඒවා පූජා භූමි ලෙසට ප්‍රකාශයට පත් කිරීම සඳහා නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත සංශෝධනය කිරීම.

10. මීට අමතරව වෙනත් ආයතන සහ පූජනීය ස්ථාන වලින් කෙරෙන ඉල්ලීම් අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරදීමට බලාපොරොත්තු වේ.

ඒ.එච්.ගාමිණී හේවගේ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

03 පරිච්ඡේදය- 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



ඒසිජ්-එන්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2020		සටහන	තක්ෂ 2020	2019	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
175,657,000	භාණ්ඩාගාර අග්‍රිම		209,650,916	237,542,000	ඒසිජ්-3
-	තැන්පතු		3,663,806	2,231,926	ඒසිජ්-4
4,700,000	අත්තිකාරම් ගිණුම්		11,026,284	13,372,871	ඒසිජ්-5/5(ඒ)/5(ඊ)
2,700,000	වෙනත් ලැබීම්		7,608,715	9,580,613	
183,057,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		231,949,721	262,727,410	
183,057,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		231,949,721	262,727,410	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
127,536,900	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	124,519,610	131,456,763	
36,630,100	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	34,938,407	48,362,061	ඒසිජ්-2(ii)
806,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	783,912	777,767	
-	පොළී ගෙවීම්	8	-		
30,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	73,661	
165,003,000	මුළු පුනරාවර්තන වියදම් (ඇ)		160,241,929	180,670,252	
	මූලධන වියදම්				
4,554,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	4,335,348	4,916,994	
1,300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	979,972	1,373,615	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-		ඒසිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-		
100,000	හැකියා වර්ධනය	14	50,000	330,400	
4,700,000	වෙනත් මූලධන වියදම්	15	3,859,010	4,881,424	
10,654,000	මුළු මූලධන වියදම් (ඉ)		9,224,330	11,502,433	
12,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		7,173,494	12,858,087	
	තැන්පතු ගෙවීම්		1,291,958	4,021,327	ඒසිජ්-4
12,000,000	අත්තිකාරම් ගෙවීම්		5,881,536	8,836,760	ඒසිජ්-5/5(ඒ)/5(ඊ)
187,657,000	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		176,639,753	205,030,772	
(4,600,000)	2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		55,309,968	57,696,638	

1

ඒසිඒ-පී

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2020 රු.	2019 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	317,265,155	319,576,683
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	29,391,773	34,536,522
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**346,656,928**	**354,113,205**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		23,400,203	30,916,801
දේපළ පිරියත හා උපකරණ සංචිතය		317,265,155	319,576,683
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	5,991,570	3,619,721
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**346,656,928**	**354,113,205**

පිටු අංක 05 සිට 49 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 50 සිට 57 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	අධ්‍යක්ෂ (මුදල්)
නම : සිරිනිමල් පෙරේරා	නම : ජී.ඩබ්.ජී.අබේගුණවර්ධන	නම : එල්.පී.චිත්‍රරත්නජන්
තනතුර : ලේකම්	තනතුර :	
දිනය : 24/12/2021	දිනය : 22.02.2022	දිනය : 21/02/22
සිරිනිමල් පෙරේරා ලේකම් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය 17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල.	ජී.ඩබ්.ජී. අබේගුණවර්ධන අධ්‍යක්ෂ ජනරාල් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව 05 වන මහල - අදියර 1 "සෙත්සිරිපාය", බත්තරමුල්ල.	එල්. පී. චිත්‍රරංජන් අධ්‍යක්ෂ (මුදල්) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව 5 වන මහල "සී" "සෙත්සිරිපාය" බත්තරමුල්ල.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය	
	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	10,189,532	10,277,950
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මඟින් එකතු කරන ලද ආදායම්		-
අග්‍රිම ලැබීම්	209,650,916	237,542,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**219,840,448**	**247,819,950**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	160,202,089	179,820,916
සහනාධාර සහ මාරුකිරීම්		-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	50,753,477	55,150,931
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**210,955,566**	**234,971,847**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**8,884,882**	**12,848,103**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	1,069,814	1,444,254
ලාභාංශ		-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	13,175	90,335
උපණය අයකර ගැනීම්		-
අත්තිකාරම් අයකර ගැනීම්	5,565,431	9,422,838
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**6,648,420**	**10,957,427**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	10,516,288	15,523,760
අත්තිකාරම් ගෙවීම්	5,017,013	8,281,770
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**15,533,301**	**23,805,530**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(8,884,882)**	**(12,848,103)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව (මිලියන)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-01-01-	රජයේ ගොඩනැගිලි කුළී ආදායම	1.10	1.10	676179.25	61.5
2002-02-99-	පොලිය - අනෙකුත්	1.2	1.2	1069813.52	89.15
2003-03-02-	විකුණුම් සහ ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	0.20	0.20	-	-
2003-99-00	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	0.2	0.2	396901.29	198.45
2004-01-00	වැන්දඹු හා අනත්දරු			5452645.62	
2006-02-02	අනෙකුත්			13175.00	

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුදල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	165,003,000.00	165,003,000.00	160,241,929.00	97%
ප්‍රාග්ධන	10,654,000.00	10,654,000.00	9,224,330.00	87%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
104-02-06-06-2506	මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය	කතරගම පූජා භූමි සංවර්ධනය	50073854.59	50073854.59	49988560.50	99.82%
102-02-07-06-2506	මුදල් අමාත්‍යාංශය	කතරගම පූජා භූමි සංවර්ධනය	2431055.68	2431055.68	380761.37	15.66%
20-1-1-4-1409	මැතිවරණ දෙපාර්තමේන්තුව	මැතිවරණ කාර්ය මණ්ඩල වියදම් ප්‍රතිපූර්ණය	242035.99	242035.99	242035.99	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	**2020.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2020.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	59,450,000.00	59,450,000.00	-	100%
9152	යන්ත්‍රෝපකරණ	101200155.37	101200155.37	-	100%
9153	ඉඩම්	156,615,000.00	156,615,000.00	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-
				-	-


3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } එව්යූඩී/ඒ/එන්පීපීඩී/02/20/05

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ජූනි 29 දින



අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීමේ හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී තැන්පතු ලැබීම් රු.3,663,806 ක් හා තැන්පත් ගෙවීම් 1,291,958 ක් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය යටතේ ගැලපීම් සිදුකළ යුතු වුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය යටතේ ගලපා තිබූ බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්ථන වියදම්

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. එසේ වුවද වැය විෂයයන් 04 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු. 41,635,000 න් එකතුව රු. 4,224,600 ක් හෙවත් සියයට 10.15 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ආ) මූලධන වියදම්

අවශ්‍යතා අනුව වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු වුවද ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය සඳහා රු. 650,000 ක්ව තිබූ වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනය ඉක්මවා රු. 2,515,200 ක් හෙවත් සියයට 287 ප්‍රතිපාදන මු.රෙ. 66 මාරු කිරීම් මගින් වෙන්කර ගෙන තිබුණි.

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ වලින් ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලද ප්‍රතිපාදන වලින් රු. 2,135,588 ක් ඉතිරිව තිබුණි. ඉන් කතරගම පූජාභූමි සංවර්ධනය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයෙන් ලද රු. 2,431,056 න් රු. 2,050,294 ක් ඉතිරිව තිබුණු අතර එම ඉතිරිවීම් සියයට 85 ක් බව නිරීක්ෂණය විය.

2.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් දෙපාර්තමේන්තුව තුල මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ලිඛිත ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

2020 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවීම් හිඟ හිටව තිබූ අත්තිකාරම් ශේෂවල මුළු එකතුව රු.386,015 ක් වූ අතර හිඟ හිටි කාලය වර්ෂ 5 ඉක්මවූ සේවය අතහැරගිය කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ආපදා ණය ශේෂය රු.30,000 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහන 14 ක් සම්බන්ධයෙන් 2019 මැයි 01 දිනෙන් පසු ඉන්ධන දහන් පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. තවද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීමේ කමිටු වාර්තා සම්බන්ධයෙන්ද විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය.

(ආ) 2017 වර්ෂයේ මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත තාවකාලිකව ලබාදී තිබුණු කැබ් රථයක් 2020 ඔක්තෝබර් මස වනතෙක් දෙපාර්තමේන්තුව වෙත බාරදී නොතිබුණි. එසේ දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් වසර 04 කට වඩා වැඩි කාලයක් වෙනත් ස්ථානයක තිබියදී රු. 79,697 ක මුදලක් ගෙවා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රක්ෂණය කර තිබුණි. තවද, 2020 ඔක්තෝබර් මස කැබ් රථය නැවත දෙපාර්තමේන්තුව වෙත බාර දෙනවිට අළුත්වැඩියා කටයුතු සිදුකළ යුතු තත්ත්වයේ පැවතුණි.

04. මානව සම්පත් කළමනාකරණය

(අ) 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 283 ක්ද වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 163 ක්ද පුරප්පාඩු 120 ක් ද විය. එනම් විධායක ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාව 51 ක් වූ අතර එයින් තනතුරු 39 ක් පුරප්පාඩුව පැවතුණි. මෙය සියයට 77 ක ප්‍රතිශතයක් විය. මීට අමතරව තෘතීයික තනතුරු සංඛ්‍යාවෙන් සියයට 38 ක්ද ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු පිළිවෙලින් සියයට 48 ක් හා සියයට 22 ක් ලෙස පුරප්පාඩුව පැවතුණි.
මේ අනුව අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩුව පවතින මුළු තනතුරු සංඛ්‍යාව සියයට 42 ක් විය.මේ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීමට නොහැකිවීමේ අවධානමක් පවතින බවද නිරීක්ෂණය විය.

(ආ) අධ්‍යක්ෂ (පාලන) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ යන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකු සියළු දීමනා සහිතව පිළිවෙලින් මාසිකව රු. 189,350 ක් හා රු. 71,745 ක් බැගින් ගෙවීමට යටත්ව බඳවා ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 10 දෙනෙකු, විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් රහිතව වෙනත් රාජ්‍ය ආයතන සඳහා මුදාහැර තිබුණි.

පී.එල්.කේ. පෙරේරා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුවේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
1. වර්තමාන රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන සේ යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය			√
2. සකස් කරන ලද කලාපීය භෞතික සැලසුම් දෙකක්.	-	-	-
3. සකස් නගර සැලසුම් i. උඩුබද්දාව ii. දමන	√		
4. ගැසට් කරන ලද පූජාභූමි i. පොළොන්නරුව පූජා භූමිය ii. බිංගිරිය රජමහා විහාරය iii. කොළවෙනිගම රජමහා විහාරය iv. ඇඹුල්ගම රජමහා විහාරය v. ඔලබොඩුව රජමහා විහාරය	√		
5. පූජා භූමි සඳහා සකස් කරන ලද වින්‍යාස සැලසුම්			
i. අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය		√	
ii. ඔලබොඩුව රජමහා විහාරය	√		
iii. මුල්කිරිගල රජමහා	√		
පහත සඳහන් ව්‍යාපෘති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ දී නිම කරන ලදී.			
• කතරගම පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය			
i. ඉදි කරන ලද පහසුකම් ගොඩනැගිලි තුන	√		
ii. ඉදි කරන ලද පොලිස් මුර පොළවල් 04	√		
iii. ඉදි කරන ලද කි.මී. 1.5 ක් දිග ආරක්ෂක වැට	√		
• අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය			
නිම කරන ලද ව්‍යාපෘති කාර්යාලය		√	
අනෙකුත් ආයතනවල ඉල්ලීම් අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර දී ඇත.			
i. කතරගම පූජා භූමිය	√		
ii. අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය	√		
iii. තිරියාය ගිරිහඬුසෑය රජමහා විහාරය	√		
iv. අම්පාර පුංචි සිගිරිය රජමහා විහාරය	√		

v.	ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාමය	√		
vi.	අළුවිහාරය පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය	√		
vii.	දැදිගම කොටවෙහෙර රජමහා විහාරය	√		
viii.	දිඹුලාගල, පල්ලේවැව ශ්‍රී අශෝකාරාමය	√		
ix.	වැවුරුකන්නල රජමහා විහාරය	√		
x.	සේරුවාවිල රජමහා විහාරය	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
පරමාර්ථ අංක 11 අංග සම්පූර්ණ ආරක්ෂක, ශක්තිමත් සහ තිරසාර නගර ඇති කිරීම	ලෝකයේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම	ලෝකයේ සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සුරක්ෂිත කිරීම සහ ආරක්ෂා කිරීමේ උත්සාහයන් ශක්තිමත් කිරීම සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන		√	
	ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම්කරණය ශක්තිමත් කිරීම මගින් නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශයන්හි සම්බන්ධතාවන් සඳහා සහාය වීම	කලාපීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන	√		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සකස් කරන ලද **තිරසර** පරමාර්ථ අතරින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ වන පරමාර්ථය වන්නේ 11 වන පරමාර්ථය වන අංග සම්පූර්ණ ආරක්ෂක, ශක්තිමත් සහ තිරසාර නගර ඇති කිරීම . එම අරමුණ ළඟා කර ගැනීම සඳහා ඉහත සඳහන් ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන ඇත. එම ඉලක්කවලට ළඟා වීම සඳහා කලාපීය සහ ප්‍රාදේශීය සැලසුම් සකස් කළ යුතුව ඇත.මෙම වාර්තාවේ 2 පරිච්ඡේදයේ 2020 වසරේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට පැවති අභියෝග යටතේ දක්වා ඇති පරිදි ප්‍රධානතම අභියෝගය වූයේ සැලසුම්කරණයට අදාලව පවතින තනතුරු පුරප්පාඩුව පැවතීමය. මීට අමතරව 2020 වසරේ පැවති කොවිඩ් - 19 තත්ත්වය තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ දී ඇති වූ තවත් අභියෝගයක් විය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	51	12	33
තෘතීයික	08	05	03
ද්විතීයික	114	60	54
ප්‍රාථමික	177	133	20

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික හා ජ්‍යෙෂ්ඨ යන සියළු මට්ටම් සැලකුවිට දැනට සිටින්නේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 65% කටත් වඩා අඩු සංඛ්‍යාවකි. 2020 වර්ෂය සඳහා සාදන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව කලාපීය භෞතික සැලසුම් 02 ක් සෑදීමට බලාපොරොත්තු වුවද, මානව සම්පත් හිඟකම නිසා එම අරමුණු ඉටුකර ගැනීමට නොහැකි විය.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
පරිගණක ආශ්‍රිත සැලසුම් ශිල්පය	2	දින 10	50,000/-		දේශීය	රාජකාරී කටයුතු සඳහා අදාළ කරගන්නා ලදී.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)			අදාල නොවේ
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම			අදාල නොවේ
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම			අදාල නොවේ
1.6	වෙනත්			
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය	අනුකූල වේ		

	යාවත්කාලීන කර පවත්වාගෙනයාම			
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	පිළිතුරු ලබා දී නොමැත	නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දී ඇත.
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			

8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		කොවිඩ් 19 හේතුවෙන් ප්‍රමාදවීම් සිදු විය. ඉදිරි දිනවල නිම කිරීමට කටයුතු කරනු ලැබේ.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර	අනුකූල වේ		

	පවත්වාගෙන යාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		නීති ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			

13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත	අනුකූල වේ		

	ඉදිරිපත් කර තිබීම			
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		වාර්තාව සකසා අවසන් කර ඇත.
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පුරවැසියන් සමග කෙළින්ම ගණුදෙනු නොකරන බැවින්, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම අනවශ්‍ය වේ.		
18.2	එම චක්‍රලේඛයේ2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම	අනුකූල නොවේ		දෙපාර්තමේන්තුවේ සෑම

	වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.			නිලධාරියෙකුටම උචිත වන පරිදි පුහුණු ඉදිරිපත්ව නොතිබූ අතර, සහභාගිවූ බොහෝ පුහුණු වැඩමුළු පැය 08 වැඩමුළු වේ.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		